
දේශපාලන හා ශාස්ත්‍රීය විශේෂාංග පුවත් සඟරාව

01 කාණ්ඩය 05 කල
2018 ජූලි / පිටු 6



ජාතික සංහිඳියාව වෙනුවෙන්
අපි ඉටු කරන මෙහෙවර ගැන
අපට ආඩම්බරයි



ජනමාධ්‍ය දඩ බල්ලෝ



හිට්ලර්ලා මුසලෝනිලා
ඔසවා තැබුවේ කවුද ?



මිතුරු
වෙසින්
පැමිණි
නිහඬ
මාරයා

# වෙනස

**දේශපාලන හා ශාස්ත්‍රීය ප්‍රවෘත්ති විශේෂාංග සඟරාව**

**ප්‍රධාන සංස්කාරක**
තුෂාල් විතානගේ

**සංස්කරණ සහාය**
උරේෂා මධුභාෂිණී
නුරාණි තෙන්නකෝන්

**නිර්මාණකරණය**
TV Media Creation & Media Consaltant

**ඡායාරූප**
ජනාධිපති මාධ්‍ය ඒකකය සහ අන්තර්ජාලයෙන්

"වෙනස" සම්පූර්ණයෙන් ම ලාබ නොලබන පුරවැසි මාධ්‍ය ප්‍රයත්නයකි. මේ පුරවැසි මාධ්‍ය වේදිකාව ඔබ වෙනුවෙන් ද විවෘතයි. එන්න අප සමග එක්වන්න... කරුණාකර ප්‍රධාන සංස්කාරක අමතන්න.
070 2080413


## පටුන


ජාතික සංහිඳියාව වෙනුවෙන් අපි ඉටු කරන මෙහෙවර ගැන අපට ආඩම්බරයි
3-7

පරිසර සංරක්ෂණය පිළිබඳව තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්, නීතිමය තත්ත්වයන්, ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිනවා
8 -12

අනාගතවාදී තීන්දුවක් සහ අත්මාර්ථකාමී සමාජයක්
13 - 17

මිතුරු වෙසින් පැමිණි නිහඬ මාරයා
18 - 22

පොලිතින් තහනම ගැන විවිධ මතවාද
23 - 29

ප්ලාස්ටික් ප්‍රශ්නයට විසඳුමක්
30 - 32

සාගින්නට හා මන්දපෝෂණයට පිළිතුරු තිරසාර කෘෂිකර්මාන්තයෙන් ලබාදිය හැකිද ?
33 - 35

මහවැලි උරුමය සුරක්ෂිත වූ අයුරු
36 - 39

හිට්ලර්ලා මුසලෝනිලා ඔසවා තැබුවේ කවුද ?
40 - 44

ජනමාධ්‍ය දඬ බල්ලෝ
45 - 51

දිළිඳුකම පිටුදැකීමේ ජනතා ව්‍යාපාරය
52 - 54

සීනි ගැන ඇත්ත නැත්ත දැන ගනිමු
55 - 58

ගොවියද ? වන සතුන්ද ?
59 - 60



# පරිසර සංරක්ෂණය පිළිබඳව තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්, නීතිමය තත්ත්වයන්, ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිනවා

ජනාධිපති
මෛත්‍රීපාල සිරිසේන

## අද

අපි මේ එක්වී සිටින්නේ ජූනි 05 වැනි දිනට යෙදී ඇති ජාත්‍යන්තර පරිසර දිනය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සංවිධානය කෙරෙන ප්‍රධාන ජාතික වැඩසටහන සමගයි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය දෙසීයකට ආසන්න සිය සමාජික රටවල් සමග ලෝක පරිසර දිනය සෑම වර්ෂයකම ජූනි මස 05 වන දින සමරනු ලබනවා. මෙවැනි දිනයක් නම් කිරීමට හේතු වුයේ ඇයි කියන කාරණය පිළිබඳව පාසල් දරුවන් ඇතුළු ඔබ සියලු දෙනා දැනුවත් ඇතැයි මා විශ්වාස කරනවා.

යම් විෂයක්, යම් ක්ෂේත්‍රයක්, ව්‍යාපෘතියක් පිළිබඳව වඩාත් ගැඹුරින් දැනුවත් විය යුත්තේ, රටක පාසල් දරුවන් ප්‍රමුඛ පොදු මහජනතාවයි. පරිසරය සම්බන්ධයේ දී ඔබගේ එම දැනුවත් බව විශේෂයෙන් වැදගත් වෙනවා. දේශපාලනඥයින් සහ රාජ්‍ය නිලධාරීන් ඒ කටයුතුවල වගකීම ගෙන ප්‍රතිපත්තිමය වශයෙන් සහ ප්‍රායෝගික වශයෙන් සැලසුම් කරමින් ක්‍රියාත්මක කිරීම සිදු කරනවා. ජාත්‍යන්තර පරිසර දිනය හෙට දවසේ මුළු ලෝකය පුරාම සමරනවා. පරිසර සංරක්ෂණයේ ඇති වැදගත්කම පිළිබඳව මුළු මහත් මානව ප්‍රජාව අද දිනයේ දැනුවත් වෙනවා. විද්‍යාඥයින් බහුශ්‍රැතයන්,

විද්වතුන්, විවිධ ක්ෂේත්‍රවල ප්‍රධානීන් වගේම ඉන් බාහිර සෑම කෙනෙක්ම මෙවැනි විෂයයක් පිළිබඳව පුළුල් අවබෝධයකින් කටයුතු කිරීම හෙට දවස වෙනුවෙන් ඉතා වැදගත් වෙනවා.

මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථාවේ දෙවනපෑතිස් මහරජතුමාට කළ දේශනයෙදීත් ඇමරිකන් භූමියේ මුල් භාරකරුවන් වූ රතු ඉන්දියානු ගෝත්‍රික නායකයා ඇමෙරිකානු ජනාධිපතිවරයාට යැවූ ඓතිහාසික ලියමනේදීත් අවධාරණය කළේ පරිසර පිළිබඳව එකම කාරණයක්. ඊට සමාන බොහෝ ප්‍රකාශ ලෝකයේ විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් ආගමික නිර්මාතෘවරුන් විවිධාකාරයෙන් ප්‍රකාශ කරලා තියෙනවා. ඒ තමයි මහපොළොව මිනිසාට පමණක් නොව සියලු සත්ත්වයාට, ගහකොළවලට,

**"මිහිඳු මහ රහතන් වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථාවේ දෙවනපෑතිස් මහරජතුමාට කළ දේශනයෙදීත් ඇමරිකන් භූමියේ මුල් භාරකරුවන් වූ රතු ඉන්දියානු ගෝත්‍රික නායකයා ඇමෙරිකානු ජනාධිපතිවරයාට යැවූ ඓතිහාසික ලියමනේදීත් අවධාරණය කළේ පරිසර පිළිබඳව එකම කාරණයක්"**

ඒ සියල්ලටමත් අයිතියි කියන කාරණය. හිරු, සඳු, ඇළ, දොළ, ගංගා, මහා කඳු හෙල්, කෙත් වතු, සතා සිව්පාවා ඒ සියල්ල මානවයාගේත් සියලු සත්ත්වයාගේත් පැවැත්ම සඳහා අත්‍යවශ්‍යයි කියන කාරණය ඔබ දන්නවා. පරිසර සංරක්ෂණය පිළිබඳව ලෝකයේ විද්වතුන්ගේ අවධානය යොමු වෙලා තියෙන්නේ දැනට දශක හතළිහක පනහක සිටයි. මෑත දශක දෙකක වගේ කාලයක් පරිසර සංරක්ෂණය පිළිබඳව, ස්වාභාවික සම්පත් ආරක්ෂා කිරීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සිට ලෝකයේ සියලු රාජ්‍ය නායකයින්ගේ දේශපාලනඥයින්ගේ ඒ වගේම රාජ්‍ය සේවාවන්හි කටයුතු කරන්නන්ගේ වගේම රාජ්‍ය නොවන සේවාවන්හි කටයුතු කරන සෑම කෙනෙක්ගේම අවධානයට ලක් වී තියෙනවා.

ලෝකයේ කාර්මීකරණය වේගයෙන් සිදුවීමේ ප්‍රතිඵලය පරිසර විනාශය බව ඔබ දන්නවා. මීට වසර විස්සකට තිහකට එහා ලෝකයේ පාලක පක්ෂ වල විශේෂයෙන් දේශපාලනඥයින් පරිසර සංරක්ෂණය පිළිබඳව නොසිතා ඒ පිළිබඳව අවධානයක් නොමැතිව කාර්මීකරණය වේගයෙන් සිදු කරන්න පටන් ගත්තා. අද ප්‍රතිඵලය ඔබ දන්නවා.

ලෝකයේ ඉහළම දියුණුවක් තිබෙන රටවල්වල පරිසර විනාශය සමග ඇති වී තිබෙන වායු දූෂණය, ගෝලීය උෂ්ණත්වය වැඩිවීමෙන් ඇති වී තිබෙන අස්වාභාවික තත්ත්වයන් කාලගුණික හා දේශගුණික විපර්යාස ඔබ දකිනවා. අද ලෝකයේ බොහෝ රටවල අධි නාගරික පරිසරයක් ගොඩනැගී තිබෙනවා.



අද ඔබ දන්නවා ලංකාවේ වැඩිපුරම වායු දූෂණය තිබෙන ප්‍රදේශය කොහෙද කියලා. ගත වූ වසර තුනකට වැඩි කාලයක් ගත්විට ලංකාවේ වැඩිම වායු දූෂණය තිබෙන ප්‍රදේශය කොළඹ කොටුව මරදාන ප්‍රදේශය. වාහනවල කාබනික දුමාරයත්, ඒ සමග ඇතිවෙලා තිබෙන වායු දූෂණයත් ඔබ දකින්න ඇති. පහුගිය අවුරුද්දේ අපේ සෞඛ්‍ය විශේෂඥයින් ප්‍රකාශයක් කළා මහනුවර නගරයේ පාසල් දරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වය ගැන. මහනුවර නගරයේ ඇතිවන බරපතළ වායු දූෂණය පිළිබඳව දැන් මේ තත්ත්වයන් එන්න එන්න වැඩි වෙනවා.

අපි මේ ජාත්‍යන්තර පරිසර දිනයේ මෙවැනි වැඩසටහන් හදලා ඇයි දරුවන් මෙතෙනට කැඳවන්නේ ඇයි දිස්ත්‍රික්කයේ සියලු රාජ්‍ය නිලධාරීන් කැඳවන්නේ. පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතනවල සියලු ප්‍රධානීන්, නියෝජිතයින් ඇයි කැඳවන්නේ. ගෞරවනීය මහා සංඝරත්නය ප්‍රමුඛ අනෙකුත් පූජකතුමන්ලාට ඇයි ආරාධනා කරන්නේ. සභාව ලස්සන කරන්න නෙවෙයි. මෙච්චර ජනතාවක් ගෙන්නේ ඇයි, තත්ත්වයේ තිබෙන භයානක කම වඩා වැඩි පිරිසකට අවබෝධ කරදීමටයි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ සිදුවන නායයාම් පිළිබඳ ඔබට අවබෝධයක් තිබෙනවා, පරිසර දූෂණය පිළිබඳ ඔබට අවබෝධයෙක් තිබෙනවා. රත්නපුර, කෑගල්ල, බදුල්ල, කළුතර, නුවරඑළිය මහනුවර මාතලේ දිස්ත්‍රික්කවලටත් මේ ප්‍රශ්න අද තදින් බලපාලා තිබෙනවා. මධ්‍ය කඳුකරයේ සිට සිදුවන බරපතළ පරිසර විනාශය හෙට දවසේ උපදින දරුවන්ගේ ජීවත්වීම පිළිබඳ ප්‍රශ්නයක් බවට පත්වෙන බව අමතක කරන්න එපා.



පැළයක් සිටුවද්දී කියන්නේ දරුවෙකුට වගේ ඒ පැළයට ආදරය කරන්න. දරුවෙක් වගේ පැළයක් රැකගන්න කියන්නේ දරුවෙකුගෙන් දකින ලෝකය පැළයක් තුළින් දැකගන්න අවශ්‍ය නිසා. මිනිසුන් අවශ්‍යයි, සතුන් අවශ්‍යයි වගේම ඒ සියලු සත්වයාගේ සහ සියලු ස්වභාවික පැවතුම්හි මූලික අවශ්‍යතාවයන් ඉෂ්ට කරන්න ප්‍රධාන වශයෙන් ඔබ දන්නවා පැළයක ගසක තිබෙන වටිනාකම. අද ඔබ දන්නවා ජාත්‍යන්තර පරිසර දිනය මුල්කරගත් මුළු ලෝක ප්‍රජාව දැනුවත් කරන ප්‍රධාන වැකිය, මෙවර තේමාව තමයි ''ප්ලාස්ටික් අවභාවිතාව නිසා සිදුවන පරිසර විනාශය අවම කර ගැනීම''. ඔබ දන්නවා අපේ රටේ ප්ලාස්ටික් පොලිතින් පාලනය කරන්න අපි පහුගිය දවස්වල තීන්දු තීරණ රැසක් ගත්තා. මම පරිසර ඇමතිවරයා විදියට 2006 නිකුත් කරපු ගැසට් නිවේදනය ක්‍රියාත්මක නොකර ඉදලා ගිය අවුරුද්දේ ඉදලා ක්‍රියාත්මක කරන්න ගත්තා. ඒ වගේ පොලිතින් පිළිබඳව අලුත් ගැසට් නිවේදන නිකුත් කළා දැඩි නීති රීති ක්‍රියාත්මක කළා.

ප්ලාස්ටික්, පොලිතින් තහනම් කළාට දැනුමක්, අවබෝධයක් තිබෙන ජනතාව ඒකට සතුටු වෙනවා. ඒකට අත්පුඩි ගහනවා ඒක හොඳයි කියනවා. පොලිතින් තහනම පිළිබඳ ගිය අවුරුද්දේ ගැසට් නිවේදනය නිකුත් කළහම පොලිතින් තහනමට විරුද්ධව මහපාරට බැහැලා ඒකට විරෝධය පළ කරපු එකම

ජනතාව ඉන්න රට ලංකාව. පොලිතින් තහනම පිළිබඳ ගැසට් නිවේදනය වළක්වන්න විශාල පිරිසක් උත්සාහ ගත්තා. කැබිනට් මණ්ඩලයටත් ඒ යෝජනාව ආවා. නමුත් මම ඒකට පසුබට වුණේ නැහැ. මම කිව්වා ගැසට් නිවේදනය ක්‍රියාත්මක කරන්න කියලා.

ලංකාවේ පොලිතින් නිෂ්පාදකයෝ, පොලිතින් කර්මාන්තකරුවන් පිටරටින් පොලිතින් ගෙන්වන අය ඒ සේවකයොත් එක්ක එම ප්‍රදේශවල නොදන්නා මහජනතාව උසි ගන්වා මහ පාරට දාලා පෙළපාලි ගියා. ලෝකයේ වෙන කිසිම රටක එහෙම නැහැ.

රජයක් වේවා වෙනත් ආයතනයක් වේවා යහපත් දේ, හොඳ දේ සද්භාවයෙන් කෙනෙක් කරනවනම් ඊට සහයෝගය දෙන්න ඕන. අවංකව ඒ සඳහා ප්‍රශංසා කරන්න ඕන.

ඔබ දන්නවා මධ්‍ය කඳුකරයේ සිට මේ මුළු ප්‍රදේශ දක්වා තෙත් කලාපය තුළ ඇතිවන පාරිසරික විනාශයන්. පස් කඳු කැපීම. එතකොට මේ පස් කඳු කපන එක වළක්වන්න ගියහම සංවර්ධනය පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කරනවා. සංවර්ධනය අත්‍යාවශ්‍යයි. නමුත් මම හිතන්නේ නැහැ තව අවුරුදු පහකටවත් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය පස් ගන්න පුළුවන්වෙයි කියලා රට ඇතුළෙන්. ලෝකයේ වෙනත් රටවල මේ සඳහා විකල්ප හොයාගෙන තියෙනවා. ඒ විකල්පයන්ට අප යා යුතු වෙනවා, අද වැලි වලට විකල්ප ලෙස මුහුදු වැලි ලෝකයේ භාවිතා කරනවා. අපිත් යම් ප්‍රමාණයක් භාවිතා කරනවා ඒ වගේම පස් වෙනුවෙන් සකස් කළ විකල්පයන් තිබෙනවා. ඒ නිසා අපිට එවැනි දේවල් සිතන්න වෙනවා. ඒ ගැන වැඩ කරන්න වෙනවා.

අද ලෝකයේ විශාල ගුවන්තොටුපළවල් තිබෙනවා. ඒ ගුවන්තොටුපළවල ඉදිකරලා තිබෙන මහා ගොඩනැගිලි වැලි, ගල්, පස්වලින් නෙවේ හදලා තිබෙන්නේ. ඒවා හදලා තියෙන්නේ යකඩ, වානේ සහ වෙනත් අමුද්‍රව්‍යවලින්. පසුගිය දශකය ගත්තොත් ඒ ඉදිකරලා තිබෙන විශාල ගුවන්තොටුපළවල් මාසයකින් දෙකකින් සම්පූර්ණයෙන් ගලවන්න පුළුවන්. ගලවලා වෙන තැනකින් සවි කරන්න පුළුවන්.

ඉතින් අපි මේ පුංචි රටේ මේ සුන්දර රටේ ස්වභාවික සම්පත්වලින් අනූන මේ රටේ සම්පත් අපි ආරක්ෂා කරගන්න ඕන. එය අද දවසට පමණක් නොවේ, එය හෙට දවස සඳහාත් අවශ්‍යයි.

ඒ නිසා මේ වැඩසටහන් වලදී සහය දෙන ඔබ සියලු දෙනාටම සියලුම රාජ්‍ය නිලධාරීන්, දරුවන්, පූජක පක්ෂය සියලු දෙනා වෙත මම ස්තුති වන්ත වෙනවා මේ සඳහා දක්වන සහයට. කරන ලද ඉදිරිපත් කිරීම් තුළ මම දැක්කා මේ ජාත්‍යන්තර පරිසර දිනයට සමගාමීව බොහොම කැපකිරීමෙන් සිදුකරන වැඩසටහනක්. මෙය පරිසර දින වැඩසටහන්වල අවසානය නෙමේ ඒ වැඩසටහන්වල ඉදිරියට යාම සඳහා ආරම්භය මේ බව මම විශේෂයෙන් සඳහන් කරනවා. ජාත්‍යන්තර පරිසර දිනයේදී මේ දෙන පණිවුඩය සමාජයට රැගෙන යාමට සහ එහි



ඉලක්ක සපුරා ගැනීම වෙනුවෙන් මේ මාතෘ භූමියේ සියලු පුරවැසියන් කැපවෙනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

පරිසර සංරක්ෂණය පිළිබඳව තිබෙන ජාත්‍යන්තර ප්‍රමිතීන්, නීතිමය තත්ත්වයන්, ආරක්ෂා කිරීමට අපි බැඳී සිටිනවා. ඒ වගකීම් ඉටුකරන්න සෑම පුරවැසියෙක්ම බැඳී සිටිනවා.

ඉලෙක්ට්‍රොනික් වගේම සායනික අපද්‍රව්‍ය පරිසර දූෂණයට දැඩි ලෙස බලපාන දෙයක්. ඒ පිළිබඳව ප්‍රමුඛ අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වෙනවා. අවිධිමත් ලෙස ගස් කැපීම වළක්වන්න ඒ සඳහා වගකිව යුතු අංශ ඒවා පාලනය කරන්න ඕනෑ.

රිලවුන්, ගවයින් සහ හැල කිඹුලන් ගහනය අධික වීම. ඒක කෑගල්ල දිස්ත්‍රික්කයට විතරක් තිබෙන ප්‍රශ්නයක් නෙවෙයි. රටටම තිබෙන ප්‍රශ්නයක්. ලංකාවේ ආහාර නිෂ්පාදනයෙන් තුනෙන් එකකට වැඩි ප්‍රමාණයක් විනාශ කරන්නේ සත්තු.

පසුගිය දිනක මගේ හිතවත් විද්‍යාඥයෙක් කිව්වා රටේ මිනිස්සුන්ට කන්න තිබෙන ආහාර සත්තුන්ට කන්න දීලා බඩගින්නේ ඉන්න ලෝකයේ එකම රට මේ රට කියලා. මම කිව්වා හුඟක් දුරට බෞද්ධාගමික පරිසරය නිසා වෙන්න ඇති කියලා. තමන්ට කන්න නැතත් සතුන්ට කන්න දීලා ඒ පින කර ගන්නවා කියලා. මේ පිළිබඳව අපි ඇමති මණ්ඩලය තුළත් වරින් වර සාකච්ඡා කරලා තිබෙනවා.

සත්ත්ව හිංසාව කියන එකත් කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. නමුත් ලෝකයේ සංවර්ධනය වූ රටවල සංවර්ධිත රටවල කෘෂිකර්මාන්තය දියුණු රටවල්වල තිබෙන ක්‍රමවේදයන් වැඩපිළිවෙළවල් මේ රටෙත් අනුගමනය කරන්න සිද්ධ වෙනවා. ලංකාවේ වඳුරු රිලව් සංඛ්‍යාව ලක්ෂ දහයකට වැඩියි. එක වඳුරෙක් දවසකට පොල් ගහකට කරන විනාශය. ලක්ෂ දහයක් එක දවසකට කරන විනාශය අති බරපතළයි. පොල් හිඟයි කියලා පොල් මිල නැගලයි කියලා ආණ්ඩුවට බනිනවා. බනින්න ඕන අපිට නොවෙයි. ඒ අයට. මේවා ස්වභාවධර්මයාත් එක්ක එන ප්‍රශ්න.

වී වගාව බහුල වන ප්‍රදේශවල මොණරා විශාල ප්‍රශ්නයක්. ඔබ දන්නවා මොණරා කතරගම දෙවියන්ගේ වාහනය. ඒ නිසා මොණරාට කවුරුවත් අත තියන්නේ නැහැ. නමුත් වෙල් යායකට බැස්සහම පොම්පෙකින් උරා ගෙන යනවා වගේ වී බුසලක් දෙකක් බඩ ඇතුළට දාගෙන තමයි ඉගිලිලා යන්නේ. ඒ නිසා අපි මොන විදියේ වැඩපිළිවෙළකට ද කඩිනම්ව යා යුත්තේ කියලා අපි තවදුරටත් සාකච්ඡා කරනවා.


වන්දනීය පූජනීය මහ සංඝරත්නය, පූජකතුමන්ලා ප්‍රමුඛව ආදරනීය කෑගලු ජනතාව, මැති ඇමතිවරු, සියලු රාජ්‍ය නිලධාරි මහත්ම මහත්මීන් මේ වැඩසටහන සඳහා දැක් වූ සහයෝගය පිළිපිළිබඳව මා ඉතාමත් සතුටට පත් වෙනවා. අප සෑම දෙනාම පරිසර සංරක්ෂණය කිරීමට කැපවෙමින් පරිසරය වෙනුවෙන් අපේ වගකීම් සහ යුතුකම් කොටස ඉටුකරමුයි කියන ගෞරවනීය ඉල්ලීම කරමින් ඔබෙන් සමුගන්නවා.

**2018 මැයි 4 වැනි දින කෑගල්ලේ පැවැති ජගත් පරිසර දින උත්සවයේ දී ජනාධිපති ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ කතාව ඇසුරිණි**



# දිළිඳුකම පිටුදැකීමේ ජනතා ව්‍යාපාරය ග්‍රාම ශක්ති



''දුප්පත්කම'' නැතහොත් දරිද්‍රතාවය මානව සංහතියේ ආරම්භයේ සිටම පවතින පොදු ප්‍රශ්නයක්. ඒ නිසා අපට බුදුන් දවසේ පවා සෝපාකලා, රජ්ජුමාලලා, සුනීතලා දකින්න ලැබුණා. එදා සිට අද දක්වා පසුගිය සියවස් ගණන පුරා ලෝකය විද්‍යාවෙන්, තාක්ෂණයෙන්, දැනුමෙන් කොතරම් ඉදිරියට ගියත් දුප්පත්කම පිටු දැකිය නොහැකි වෙලා තිබෙනවා. එය අදත් ගෝලීය ප්‍රශ්නයක්, අභියෝගයක් වශයෙන් සලකනවා.

මේ තත්ත්වය තුළ දුප්පත්කම / දරිද්‍රතාවය සහමුලින්ම පිටුදැකීම සඳහා පසුගිය කාලය පුරා ගෝලීය වශයෙන් සේම දේශීය වශයෙන් ද විවිධ ඉලක්ක ඉදිරිපත් වූ අතර විවිධාකාර නාමයන් යටතේ වැඩසටහන්, ව්‍යාපෘති රැසක් දියත් වුණා. ඒත් ලෝකය වගේම ලංකාවෙත් දරිද්‍රතාවය තවමත් විසඳුම් ලබා දිය යුතුව තිබෙන දැවැන්ත සමාජ හා දේශපාලන අර්බුදයක් බවට පත්ව තිබෙනවා. මේ තත්ත්වය මත එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පසුගිය 2015 දී ඉදිරිපත් කළ ''තිරසර සංවර්ධන අභිමථාර්ථ'' තුළ ගෝලීය වශයෙන් මෙන්ම රටවල් වශයෙන් ද දුප්පත්කම පිටුදැකීම ප්‍රමුඛ ඉලක්කය බවට පත් වුණා.

මෛත්‍රීපාල සිරිසේන මහතා විධායක ජනාධිපති ධූරයට පත් වූ වහාම එතුමාගේ සුවිශේෂ අවධානයක් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීම වෙනුවෙන් යොමු වුණා. ඒ අනුව එක්සත් ජාතීන් විසින් හඳුන්වා දුන් තිරසර සංවර්ධන අභිමථාර්ථ ඉටුකර ගැනීම සඳහා ඒ පිළිබඳ කැබිනට් අමාත්‍යාංශයක් පවා ස්ථාපිත කිරීමට පියවර ගත්තා. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිළිබඳ සංඛ්‍යා ලේඛන විමසා බලන විට පසුගිය තෙවසර තුළ දරිද්‍රතාවය විශාල ලෙස අඩුවී තිබෙන බව සංඛ්‍යා ලේඛන හෙළි කරනවා. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව 2017ට අනුව 2002 දී සියයට 22.7ක අගයක පැවැති

ජනගහන දරිද්‍රතා දර්ශකය 2016 දී සියයට 4.1 දක්වා අඩු අගයක් දක්වා ගෙන ඒමට අපට හැකිවෙලා තිබෙනවා. එහෙත් මේ අවම සංඛ්‍යාව තුළ සියුම් විෂමතා කිහිපයක් තිබෙනවා. ඒ නාගරික ප්‍රදේශවල දරිද්‍රතා දර්ශකය 1.9ක් වන විට ග්‍රාමීය ප්‍රදේශවල 4.3ක් ද වතු ප්‍රදේශවල සියයට 8.8ක් ද වශයෙන්. මේ සමග ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා පළාත් විෂමතා ද තිබෙන බව අප වටහා ගත යුතුයි.

මේ තත්ත්වයට පත්වීම කෙරෙහි ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය පිටුදැකීම සඳහා පසුගිය කාලය පුරා ක්‍රියාත්මක කළ විවිධ සමාජ සුභසාධන හා ආර්ථික සංවර්ධන වැඩසටහන් විසින් ප්‍රමුඛ කාර්යයභාරයක් ඉටුකළ බව පෙනී යනවා. උදාහරණයක් ලෙස පසුගිය කාලය තුළ ක්‍රියාත්මක වූ ''ජනසවිය'' ''සමෘද්ධිය'' ''දිවිනැගුම'' ආදි සමාජ සුබසාධන වැඩසටහන් මගින් මෙරට අතිවිශාල ජනතාවක් දරිද්‍රතාවයේ සීමාවෙන් ඉහළට ඔසවා තැබීමට හැකියාව ලැබී තිබුණා.

එහෙත් මේ සමාජ සුබසාධන වැඩසහන් සඳහා අති විශාල රාජ්‍ය වැය බරක් දැරීමට රටට සිදුවූ තිබෙනවා. උදාහරණයක් ලෙස ලංකාවේ දරිද්‍රතා දර්ශකයෙන් පහළ සිටින ජන අනුපාතය සියයට 4.1ක් වුණාට 2017 දී දිවිනැගුම/සමෘද්ධි සහනාධාරය ලැබූ පුද්ගලයින් ගණන 13,88, 241ක් වුණා.

එයින් අදහස් වෙන්නේ ලංකාවේ දරිද්‍රතාවයෙන් පසුවන ජන සංඛ්‍යාව සියයට 4.1ක් වන විට දුප්පතුන් වෙනුවෙන් රජය විසින් ලබා දෙන සහනාධාරයට හිමිකම් කියන පවුල් ඒකක සංඛ්‍යාව ආසන්න වශයෙන් රටේ සමස්ත පවුල් ඒකක සංඛ්‍යාවෙන් (ලක්ෂ 52ක් පමණ වන) 4/1කටත් වඩා වැඩි අගයක් ගන්නා බවයි.

මෙහි අති සුවිශේෂත්වය වන්නේ සමෘද්ධි සහනාධාරය (නිලධාරීන් 27000 සඳහා වැටුප් ආදිය හැර) සඳහා පමණක් රුපියල් මිලියන 39,707ක් වැය කිරීමට රජයට සිදුව තිබීමයි. මේ තත්ත්වය මේ වන විට රටට දැරිය නොහැකි වැය බරක් බවට පත්ව තිබෙනවා. ඒ වගේම රුපියල් 3500-1000ක් වැනි මුදලක් ගෙවන මේ සුබසාධන වැඩසටහන්වල ඵලදායීතාවය ගැනත් දැඩි විවේචනයක් තිබෙනවා. මේ තත්ත්වය තුළ ''දිළින්දන්ට මාළු කුරියෙක් වෙනුවට බිලි පිත්තක් දෙන්න'' කියන ප්‍රකට කියමන යළි රජයේ අවධානයට යොමුව තිබෙනවා.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සංකල්පයක් අනුව ''ග්‍රාම ශක්ති'' සංකල්පය ක්‍රියාත්මක වන්නේ දිළින්දන්ට මාළු කුරියෙක් වෙනුවට බිලි පිත්තක් ලබා දෙන්න කියන අදහස වඩ වඩාත් අවධාරණය වන යුගයකයි. මේ තත්ත්වය වඩාත් සරල ලෙස ප්‍රකාශ කළහොත් ජනාධිපතිවරයාට අවශ්‍යව තිබෙන්නේ 2030 වන විට ශ්‍රී ලංකාවේ දිළිඳුකම/දරිද්‍රතාවය පිටුදැකීම හුදු සංඛ්‍යා ලේඛන හරඹයකින් ඔබ්බට ගිය තිරසාර වැඩපිළිවෙළක් බවට පත්කර ගැනීමටයි. සැබැවින්ම දුප්පතුන් නැති, ස්ව ශක්තියෙන් නැගී සිටින ජනතාවක් සිටින රටක් බිහි කිරීමටයි. අප මුලින් සඳහන් කළ ආකාරයට පසුගිය කාලය පුරා රුපියල් බිලියන දහස් ගණනක් වැය කළ මූල්‍යමය ගෙවීම් (මාළු කුරියා) වෙනුවට බිලිපිත්තක් ලබා දෙන වැඩපිළිවෙළකුයි ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් අරඹා කර තිබෙන්නේ.

ශක්තිමත් හා ගෞරවාන්විත ආර්ථිකයකින් හෙබි තිරසාර ශ්‍රී ලංකාවක් තුළ සියලු ආකාරයේ දිළිඳුකම මුලිනුපුටා දැමීම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සංකල්පයක් අනුව ක්‍රියාත්මක වන ග්‍රාම ශක්ති වැඩසටහනේ පරමාදර්ශී අරමුණයි. 2017 දිළිඳුකමින් මිදීමේ වර්ෂයට'' සමගාමීවයි මෙම වැඩසටහන දියත් වන්නේ.

ග්‍රාමශක්ති ව්‍යාපාරයේ අරමුණ වන්නේ, වැඩි කාන්තා සහ තරුණ දායකත්වයක් ලබා ගනිමින්, වෙළෙඳපොළ අවස්ථා ගැන සංවේදීව, ගමේ සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීමේ ශක්තිය ලබා දෙමින්, එම සැලසුම් ප්‍රාදේශීය සහ පළාත් සංවර්ධන සැලසුම් සමග ඒකාබද්ධ කිරීමයි. ඉදිරි වර්ෂ 12 දී දිළිඳුකම තුරන් කරමින් ගෝලීය තිරසර සංවර්ධන ඉලක්ක සපුරා



ගැනීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වශයෙන් සැලකෙනවා. ඒ අනුව සමස්ත අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, රැකියා උත්පාදනය, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ ආයතන ව්‍යුහය කෙරෙහි අවධානය යොමු කෙරෙනවා.

මෙහිදී සිවු වැදෑරුම් ප්‍රවේශයක් යටතේ ග්‍රාමශක්ති ව්‍යාපාරය ක්‍රියාත්මක වන බව සඳහන් වෙනවා.

1. පිටුදැකිය යුතු දිළිඳුකමේ ස්වභාවය.
2. පවුල් හා ප්‍රදේශ ඉලක්ක කිරීම.
3. දිළිඳුකමට බලපාන හේතු නැති කිරීම සඳහා රාජ්‍ය අංශයේ මැදිහත්වීම.
4. ආයතනික ව්‍යුහය සැලසුම් කිරීම සහ දිළිඳුකමට බලපාන හේතු නැති කිරීම සඳහා පෞද්ගලික අංශය මැදිහත්වීම, මේ අතර වෙනවා.

ඉහත ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක වන ග්‍රාමශක්ති ව්‍යාපාරය ශක්තිමත් මූලධර්ම කිහිපයක් මත පදනම් වෙලා තිබෙනවා. ඒ අනුව,

- ❖ සියලු දෙනා ඇතුළත් වන ක්‍රමයක් මගින් ජාති, ආගම්, දේශපාලන භේද නැතිව ප්‍රජාවේ සෑම ගෘහස්ත ඒකකයකටම සංවිධානයට බැඳීමට ඇති අයිතිය පිළිගැනීම.
- ❖ දුප්පතාට, කාන්තාවන්ට හා තරුණ තරුණියන්ට ප්‍රමුඛතාව ලබාදීම.
- ❖ විනිවිධභාවය - කරුණු නොසඟවා හෙළි කිරීම, ගන්නා තීරණ හා ඒවායේ ප්‍රතිඵල ගැන වගඋත්තර කීමට බැඳී සිටීම.
- ❖ අය - වැය බෙදා ගැනීම - ප්‍රාග්ධන පිරිවැයෙන් යම් කොටසක් අනුන්ගෙන් නොයැපී ප්‍රජාව විසින් ම දැරීම, යන මූලධර්ම ග්‍රාම ශක්ති වැඩසටහනට ශක්තිමත් පදනමක් නිර්මාණය කරනවා.

ඉහත මූලධර්මවල අත්‍යවශ්‍යභාවය, සේම වැදගත්කම පසුගිය කාලය පුරා දේශපාලන පක්ෂ පාට ආදී විවිධාකාර පටු වුවමනා එපාකම් ප්‍රමුඛ කර ගනිමින් ක්‍රියාත්මක වූ ග්‍රාමීය සංවර්ධන හා සුබසාධන වැඩසටහන් පිළිබඳ ඇති සෘණාත්මක ආකල්ප මගින් මනාව පැහැදිලි වෙනවා. විශේෂයෙන් හුදු පුද්ගල අභිප්‍රේරණයක් වෙනුවට දුප්පත්කම ජය ගැනීමේ සටනේ කේන්ද්‍රීය සාධකය වශයෙන් හඳුනා ගෙන ඇති කාන්තාවන් හා තරුණියන්ට මෙම වැඩසටහන මගින් ප්‍රමුඛත්වය ලබාදීම තුළ මෙම ව්‍යාපාරයේ සුවිශේෂ වෙන බවක් දැකිය හැකියි.

දරිද්‍රතාවය නැතහොත් දිළිඳුකම පිටුදැකීම සඳහා පසුගිය කාලය පුරා අඛණ්ඩව දියත් වූ විවිධාකාර වැඩසටහන්වලට සාපේක්ෂව ග්‍රාම ශක්ති වැඩසටහන සුවිශේෂ වන කරුණු කිහිපයක් තිබෙනවා. ඒවා මෙම වැඩසටහනේ ප්‍රයෝජන වශයෙන් සඳහන් කළ හැකියි.

- ශක්තිමත් ජනතා සමාගමක් ග්‍රාමීය මට්ටමින් නිර්මාණය වීම.
- සියලු ජනතාවගේ සහභාගිත්වයෙන් ගොඩනැගෙන ග්‍රාමීය සංවර්ධන සැලසුමක් අනුව ක්‍රියාකාරී වීම.
- ඒක පුද්ගල ආයෝජනය රුපියල් 8000.00ක් ලෙස ගණනය කළ රාජ්‍ය ආයෝජනයක් සිදුවීම.
- යැපුම් මානසිකත්වයෙන් මිදී ව්‍යවසායකත්වය වෙත එළඹීමට විශේෂ පුහුණුවක් ලබාදීම.
- ග්‍රාමීය ප්‍රාග්ධනය ශක්තිමත් කරන ග්‍රාමීය ඉතුරුම් ක්‍රමයක් බිහි කිරීම.
- පෞද්ගලික අංශයේ නිර්මාණාත්මක මැදිහත්වීම මගින් දේශීය හා ගෝලීය සැපයුම් දාමයන් / අගය දාමයන් වෙත සම්බන්ධවීමට ග්‍රාමීය ක්ෂුද්‍ර සමාගම් වෙත අවස්ථාවක් ලබාදීම.
- තම නිෂ්පාදනයන්ට ගමේදී ම අගය එකතු කිරීමට අවශ්‍ය දැනුම, තාක්ෂණය සහ උපකරණ ලබාදීම.
- ව්‍යවසායකත්ව සහ තාක්ෂණ කේන්ද්‍රයක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බිහිවීම.
- දිළිඳුකම පිටුදැකීම සඳහා දැනට ක්‍රියාත්මක වන වැඩසටහන් අගයමින් ඒවා සමග සහයෝගයෙන් ක්‍රියාත්මක විය හැකි ක්‍රමයක් වීම.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා පසුගිය දා අවධාරණාත්මකව පවසා සිටියේ කිසිඳු හේතුවක් නිසා ග්‍රාම ශක්ති ව්‍යාපාරය අතරමග නතර කිරීමට තමා ඉඩ නොදෙන බවයි. ග්‍රාමීය හා ප්‍රාදේශීය වශයෙන් සංකීර්ණ අභියෝගයක්ව පවතිනා දිළිඳුකම ජයගත හැකි වන්නේ ශක්තිමත් හා නිර්මාණශීලී මැදිහත්වීමකින් පමණක් බව අපට ඉතිහාසය විසින් ඔප්පු කොට තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ ග්‍රාම ශක්ති වැඩපිළිවෙළ තිරසාර වැඩසහනක් වන බව පැහැදිලි කරුණක්. 2030 දී දුප්පත්කමින් තොර ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා වන ඉලක්කය ජයග්‍රහණය කළ හැකි වන්නේ මෙවැනි ප්‍රවේශයකින් පමණක් බව ද පැහැදිලියි.■